**පදියතලාව ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

### (අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.54,353 ක පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | 2020 අවසන් ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| ii. සමාලෝචිත වර්ෂයේ නගර සැලසුම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉටුකළ කර්මාන්ත 02 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන රු.80,258 ක් වැඩියෙන් සලසා තිබුණි. | නිවැරදි වටිනාකම සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | පිළිගනිමි. |
| iii. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.654,357 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | 2020 ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි' |

(ආ) **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) රු.686,493,878 ක් වූ වත්කම් විෂයන් 02 ක් හා රු.5,667,769 ක වගකීම් විෂයන් 02 ක් සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | මේ වන විට සකස් කර ඇත. |
| (ii). මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු රු.632,440,853 ක ඉඩම් හා ගොඩනැගිලි, රු.1,581,500 ක යන්ත්‍රෝපකරණ හා රු.3,947,182 ක ලී බඩු හා සවිකිරීම් සඳහා උපලේඛන දක්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් සඳහා උපලේඛන පිළියෙල කළ යුතු වේ. | 2020 අවසන් ගිණුම් සකස් කිරීමේ දී උපලේඛන ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

------------------

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 126 වගන්තිය | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පනවා අදාල වියදම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති හා ප්‍රඥප්ති විධිවිධාන | | | |
| රීති 217 | ප්‍රාදේශීය සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති මාලාව අනුව කටයුතු කළ යුතු වේ. | 2019/08/08 දින මඩකලපුව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර අදාල තක්සේරු වාර්තා ලැබුණ පසු ඇතළත් කරමි' |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදුකළ යුතු වේ. | 2020 ජුනි මස ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත' |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,083,263 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,081,847 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | බිල්කළ ආදායම (රු.) | රැස්කළ ආදායම් (රු.) | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.) | ඇස්තමේන්තුගත ආදායම (රු.) | බිල්කළ ආදායම (රු.) | රැස්කළ ආදායම් (රු.) | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.) |
| වරිපනම් බදු | 231,000 | 205,500 | 205,500 | - | 171,000 | 198,105 | 198,105 | - |
| කුලී ආදායම | 6,892,000 | 4,960,497 | 4,541,449 | 937,488 | 7,634,574 | 5,104,426 | 4,635,486 | 518,440 |
| බලපත්‍ර ගාස්තු | 502,000 | 430,060 | 430,060 | 0 | 959,000 | 269,750 | 269,750 | 0 |
| වෙනත් ආදායම | 3,247,912 | 2,339,949 | 2,186,449 | 1,129,454 | 2,826,573 | 2,508,167 | 1,568,461 | 975,954 |
| | **10,872,912** | **7,936,006** | **7,363,458** | **2,066,942** | **11,591,147** | **8,080,448** | **6,671,802** | **1,494,394** |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

**මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.787,940 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතු වේ. | මුද්දර ගාස්තු රු.893,672 මුදලින් රු.105,732 මුදලක් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | කරුණු 05 ක් ඉටුකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රාදේශිය පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇත. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි' |

#### (ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. 1998 සිට ස්ථිර පදනමින් බඳවාගෙන තිබුණු මාර්ග කම්කරුවන් 05 දෙනෙකු හා අනියම් පදනමින් බඳවාගෙන තිබුණු මාර්ග කම්කරුවකු අදාල රාජකාරියේ යොදවා නොගෙන වෙනත් රාජකාරි සඳහා යොදවාගෙන තිබුණි. | බඳවාගනු ලබන කම්කරුවන් තනතුරට අදාල රාජකාරියේ යෙදවිය යුතු වේ. | අප සභාව සතුව ප්‍රමාණවත් ආදායමක් නොමැති බැවින්, නව සේවකයෙකු බඳවා ගැනීමේදී ඔහුගේ දීමනා සභාවේ ආදායම් මත ගෙවීමට සිදුවන නිසා මේ වන විටත් අනියම් පදනම මත බඳවාගෙන සිටි සේවකයින් තාවකාලිකව අදාල රාජකාරියේ නොයොදා වෙනත් රාජකාරි සඳහා යොදවා ඇත. |

| | | |
|---|---|---|
| ii. ප්‍රාදේශීය සභාව විසින් කසළ බැහැර කරන භූමිය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | කසල බැහැර කරන භූමිය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වේ. | මධ්‍යම පරිසර අධිකාරිය වෙත පරිසර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අතර භෞතික පරික්ෂාවෙන් අනතුරුව නිර්දේශයන් ද ඉදිරිපත් කර ඇත' |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වීම හා ඉලක්ක අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සඳහා කාර්යය මණ්ඩල යොමු කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ ඉදිකර බදු දී තිබුණු කඩකාමර 03 ක් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩකාමර තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩකාමර තක්සේරු කිරීම සඳහා 2019 වර්ෂයේ අවස්ථා 03 කදී ඉල්ලීම් කර ඇතත් තක්සේරුව මේ වන තෙක් ලැබී නැත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 05 ක පුරප්පාඩු 06 ක් පැවතුනි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු වේ. | සේවක පුරප්පාඩු විස්තර අදාල ආයතන වෙත යොමු කරන අතර මේ දක්වා සේවකයන් ලබා දීමට කටයුතු කර නොමැත. |
| (ආ) සභාවේ සේවය කර ස්ථාන මාරු වූ, විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් දීර්ඝ කාලයක සිට අයවිය යුතු රු.138,274 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය නොවී පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරියේ දී කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාව පරිහරණය කරන වාහන 07 ක අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | වාහන වල නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගත යුතු වේ. | සභාවට අයත් වාහන 07 ක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු දැනට සිදු වෙමින් පවති' |

**3.4.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝගිතා වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 07 කින් ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු කඩකාමර බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අනුමත අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. |